ඔබ අතුරින් කිසිවකු හෝ තම පවුල සම්බන්ධෙයන් දිවුරා සිටීමෙහි ඉක්මවා යෑම, අල්ලාහ් අනිවාර්යය කළ කෆ්ෆාරා (ප්රතිකර්මය) පිරිනැමීමට වඩා අල්ලාහ් අභියස එය බරපතල පාපයකි.

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ප්රකාශ කළ බව අබූ හුරෙය්රා - රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. ((ඔබ අතුරින් කිසිවකු හෝ තම පවුල සම්බන්ධෙයන් දිවුරා සිටීමෙහි ඉක්මවා යෑම, අල්ලාහ් අනිවාර්යය කළ කෆ්ෆාරා (ප්රතිකර්මය) පිරිනැමීමට වඩා අල්ලාහ් අභියස එය බරපතල පාපයකි.))
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

හදීසයේ තේරුම: මුස්ලිම්වරයකු තම පවුල හා බැඳුණු කරුණක් සම්බන්ධයෙන් දිවුරුමක් කර ඇත්නම්, ඔවුහු ද පීඩාවට පත් වී, තමන් කළ දිවුරුමෙන් නැවත හැරීමක් නොවන්නේ නම් ඔහු මහා පාපයක් සිදු කර ඇත. පසුව තම පවුල සම්බන්ධයෙන් කළ දිවුරුම නොසළකා අඛණ්ඩව සිටින්නේ නම්, අල්ලාහ් අභියස ඔහුට මහා පාපයක් වේ. එනම්: මහත් පාපයක් මෙන්ම බරපතල වරදකි. "අල්ලාහ් ඔහු වෙත අනිවාර්යය කළ කෆ්ෆාරා හෙවත් ප්රතිකර්මය දීමට වඩා" යන්නෙහි තේරුම: නියත වශයෙන්ම දිවුරුම සඳහා වූ අල්ලාහ් නියම කළ ප්රතිකර්මයන් නම් කොට ඇත. නමුත් ඔහු එම දිවුරුම මත අඛණ්ඩව නොසිට. ඔහු එම දිවුරුමින් හැරෙන කල්තාක් පාපයක් නොවන්නේය. නමුත් එම දිවුරුම මත අඛණ්ඩව සිටින්නේ නම් පාපයක් හා බරපතල වරදක් වනු ඇත. හේතුව එය පවුලට පීඩා ගෙන දෙන බැවිනි. එම විෂයයෙහි අල්ලාහ් පුළුල් භාවයක් ඇති කොට ඇත. බුහාරි හා මුස්ලිම් හි එන හදීසයක මෙසේ සඳහන් වේ. ඔබ යම් දිවුරුමක් මත් දිවුරා සිට පසුව එය නොවන ඊට වඩා යහපත් දෙයක් දුටුවෙහි නම් එම යහපත ගෙන එනු. ඔබේ දිවුරුමට ප්රතිකර්මයක් කරනු. ඉමාම් නවවි සතු මුස්ලිම්හි විග්රහය (11/123) ෆත්හුල් බාරී (11/519) මිර්කාතුල් මෆාතිහ් (6/2239)

https://sunnah.global/hadeeth/si/show/8963